# උතුරු සංවර්ධනයට බිලිවන විල්පත්තුව



වසර තිහක කාලයක් පැවැති රුදුරු එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදය අද වන විට සම්පූර්ණයෙන්ම තුරන් කර ඇත. රටේ සංවර්ධනය, ප්‍රජාතන්ත්‍රවාදය හා සිවිල් ජන ජීවිතය නැවත ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒමට ඒ ඔස්සේ හොඳ අවස්ථාවක් උදා වී තිබේ. නිවැරදි ලෙස සැළසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම තුළින් සමෘද්ධිමත් දේශයක් ගොඩ නැගීමට වර්තමානය හොඳ අවස්ථාවක් සපයයි. යුද්ධයෙන් දිනා ගත් නිදහස, යථාර්ථයක් බවට පත් කළ හැක්කේ ද මෙවන් නිසි සැළසුමක් තුළිනි. එසේ නොමැති වුවහොත් සිදුවන්නේ රුදුරු කොටි ත්‍රස්තවාදීන් සංවර්ධනයටත්, ප්‍රජාතන්ත්‍රවාදයටත්, රටේ ස්වෛරීභාවයටත්, සිවිල් ජන ජීවිතයටත් එල්ල කළ මරු පහර එලෙසම ඉදිරියට ගෙන යාමකි.

එහෙත් අදවන විට විල්පත්තුව ජාතික වනෝද්‍යානය තුළ මේ වන විට සිදුවෙමින් පවතින්නේ කුමක්ද? පුත්තලම හා මන්නාරම අතර සම්බන්ධතාවය ඇති කිරීම සඳහා විල්පත්තුව ජාතික වනෝද්‍යානය හරහා පමණක් කිලෝමීටර් 35 ක දිගින් යුතු දැවැන්ත මාර්ගයක් නාවික හමුදාව විසින් ඉදි කරමින් පවතී. පාලම් තුනකින් සමන්විත මෙම මාර්ගය එලුවන්කුලම ප්‍රදේශයේ කලා ඔයෙන් (විල්පත්තුව ජාතික වනෝද්‍යානයේ දකුණු මායිමෙන්) ආරම්භ ව න අතර උප්පුආරු (මෝදරගම් ආරු), පූකුලම් ප්‍රදේශය දක්වා (විල්පත්තු ජාතික වනෝද්‍යානයේ උතුරු මායිම) විහිදේ. මෙම මාර්ගය ඉදිකිරීම සඳහා විල්පත්තුව ජාතික වනෝද්‍යානය තුළ තැනින් තැන වනාන්තර හා විල්ලු ඉතා විශාල ප්‍රමාණයක් වැනසීම සිදු කර ඇත. වනෝද්‍යානය තුළ තැනින් තැන වනාන්තර හා විල්ලු පරිසර වල විශාල වලවල් හාරා මාර්ගය සැකසීමට පස් ලබා ගැනීම සිදු කර තිබේ. මෙම වලවල් අලි ඇතුන්ගේ මර උගුල් වීමට අනාගතයේදී බොහෝ දුරට ඉඩ ඇත.

විල්පත්තුව ජාතික වනෝද්‍යානයේ වනාන්තර කොල්ලය මෙතෙකින් නතර වී නොමැත. වර්තමානය වන විට විල්පත්තු ජාතික වනෝද්‍යානයේ වෙරළ තීරය දිගේ මන්නාරමේ සිට පුත්තලම දක්වා අලුතින් තවත් මාර්ගයක් ඉදි කරමින් පවතී. එහි බොහෝ කොටසක් මේ වන විට සකසා අවසන් කර ඇත. මාර්ගය හා මුහුදුවෙරළ අතර තීරය සංචාරක පුරවරයක් බවට පරිවර්තනය කිරීමට ද සූදානමක් ඇත. ඒ සඳහා සියලු සැළසුම් සකස් කර අවසන්ය. තව නොබෝ දිනකින් ම හොර රහසේ එම ක්‍රියාමාර්ග ද ආරම්භ වනු ඇත.

විල්පත්තුවේ වනාන්තර විනාශය හා නීති විරෝධී ක්‍රියා මින් නැවතී නැත. වනෝද්‍යානය තුළ පූකුලම් හා මෝදරගංආරු හරහා ඉදි කරන මොල්ලිකුලම් පාලම අතර සීමාවේ කිලෝමීටරයක් පමණ දිගින් යුත් විශාල වනාන්තර ප්‍රදේශයක් කම්බි කණු යොදා වෙන් කර ඇත. ජාතික වනෝද්‍යානයක ඉඩම් මේ ආකාරයෙන් වෙන් කර ගත හැක්කේ කුමන නීතියක් යටතේද? මෙම වනාන්තරය රුදුරු එල්.ටී.ටී.ඊ. ත්‍රස්තයින්ගෙන් මුදා ගෙන සිවිල් පාලනයට නතු කළේ එල්.ටී.ටී.ඊ. සංවිධානය කළ දැවැන්ත හානියට වඩා වැඩි හානියක් පරිසරයට සිදු කිරීමට දැයි අපට නොවැටහේ.

කිසිදු සැළසුමකින් හෝ පරිසර හා වනජීවී ආරක්ෂණ උපාය මාර්ග වලින් තොරව ඉතා අවිධිමත් ලෙස මෙම මාර්ගය ඉදිකරමින් පවතී. ඒ සඳහා විල්පත්තුව පාලනය කරන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කිසිදු අවසරයක් හෝ විශේෂඥ උපදෙස් හෝ ලබා ගෙන නැත. එපමණක් නොව වනජීවී නිලධාරින්ගෙන් වසං කරමින් ඔවුනට වනෝද්‍යානය තුළට ඇතුලු වීමට ඇති අයිතිය පවා නොතකමින් මෙම සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කරමින් තිබේ.

අක්‍රමවත් පස් කැණීම් හා මාර්ගයේ පස් පිරවීම් හේතුවෙන් වර්ෂා කාලයේදී ඒ ආශ්‍රිතව පිහිටි විල්ලුමය තෙත් බිම් සියල්ල ගොඩ වීමට ලක් විය හැකිය. මෙපමණක් නොව වනෝද්‍යානය දෙකඩ කරමින් ගමන් ගන්නා මෙම මාර්ගය හේතුවෙන් සමස්ථ විල්පත්තු වනජීවී වාසස්ථානය සම්පූර්ණයෙන්ම දෙකඩ වීම සිදුවී ඇත. ඉන් සිදුවන ජෛව විවිධත්ව හානිය සුළු පටු නොවේ. 2010 ජනවාරි මස 24 වන දින මෙම මාර්ගය මහජනතාව සඳහා විවෘත වීමත් සමගම මෙම මාර්ගයේ වාහන ගමනා ගමනය ඉතා අධික විය. මෙය ජනාකීර්ණ මාර්ගයක් බවට අද වන විට පත්ව ඇත. මේ හේතුවෙන් විල්පත්තුව ජාතික වනෝද්‍යානයේ ජීවත් වන සත්ත්ව ප්‍රජාව වනෝද්‍යානයේ කොටස් දෙකකට කොටු වී ඇත. අලිඇතුන්ගේ වාසස්ථාන ඛණ්ඩනය වී ඇත. කොටින්ගේ ගොදුරු බිම් ඛණ්ඩනය වීම හේතුවෙන් එම සතුන්ගේ ගහණ ඝනත්වයට ඇඩි බලපෑම් එල්ල විය හැකිය. මාර්ග අනතුරු හේතුවෙන් මිය යන සත්ත්ව ප්‍රජාව අධික වී ඇත. මේ සියලු තත්ත්වයන් හේතුවෙන් නීති විරෝධී ලෙස කිසිදු සැළසුමකින් තොරව ඉදිකළ මෙම මාර්ගය විල්පත්තු ජාතික වනෝද්‍යානයේ ජෛව ප්‍රජාවගේ පැවැත්මට මරු පහර වී ඇත.

විල්පත්තු ජාතික වනෝද්‍යානය යනු වනෝද්‍යාන සංකීර්ණයකි. කොටස් පහකින් යුක්ත විල්පත්තුව ජාතික වනෝද්‍යානයේ පළමු කොටස ප්‍රකාශයට පත් කළේ 1938 පෙබරවාරි 25 වනදාය. අනුරාධපුරය හා පුත්තලම දිස්ත්‍රික්ක දෙකට අයත් එහි භූමි ප්‍රමාණය හෙක්ටයාර 54953.2 කි. ඉන්පසුව 1967.04.28 වන දින හෙක්ටයාර 7021.4 ක් ද, 1969.08.27 වන දින හෙක්ටයාර 22981.4 ක් ද, 1969.12.05 වන දින හෙක්ටයාර 25252.9 ක් හා 1973.12.07 වන දින හෙක්ටයාර 21484.8 ක් වශයෙන් කොටස් 5 ක් ලෙස විල්පත්තු ජාතික වනෝද්‍යානය ප්‍රකාශයට පත් කර තිබේ. අද වන විට ඊට අයත් සම්පූර්ණ වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර 131693.7 කි. මීට අමතරව විල්පත්තුව ජාතික වනෝද්‍යානය හා සම්බන්ධව තවත් වනාන්තර ගණනාවක් සම්බන්ධ වෙමින් විශාල වනජීවී වාසස්ථානයක් ගොඩ නැගී ඇත. එනම් විල්පත්තුව උතුරු අභය භූමිය, තබ්බෝව අභය භූමිය හා වීරක්කුලිචෝලේ - එළුවන්කුලම යෝජිත රක්ෂිතය වැනි වනාන්තරය. මෙසේ විල්පත්තු හා ඒ හා සම්බන්ධව ගොඩ නැගී ඇති අනෙක් වනාන්තර පරිසර පද්ධති හේතුවෙන් වනජීවීන් අති බහුතරයකට ලැබුණු රැකවරණය හා කලා ඔය, මෝදරගංආරු වැනි ගංගාවන්ගේ ජල පෝෂක ප්‍රදේශ වැනසීම මෙම මාර්ගය ඉදි කිරීම සඳහා එළි පෙහෙළි කළ වනාන්තර හා පස් කැපීම හේතුවෙන් අහිමි වී ඇත.

එපමණක් නොව විල්පත්තුව යනු වනජීවී වාසස්ථාන හා ගංගාවන්ගේ ජල පෝෂක ප්‍රදේශයක් පමණක් නොව අති දැවැන්ත පුරා වස්තු සම්භාරයක් සඟවා ගත් අප ජාතියේ ඉතිහාසය ගැබ්ව පවතින ධන නිධානයකි. ඉන්දියාවෙන් පැමිණි විජය රජු ගොඩබට තම්බපන්නිය පිහිටා ඇත්තේ ද විල්පත්තුව ජාතික වනෝද්‍යානයේ ය. විජය රජුගේ ආගමනයට පෙර කුවේණිය තුළින් ඉස්මතු වූ ලාංකේය සංස්කෘතියේ අක් මුල් රැඳී ඇත්තේද විල්පත්තුව ජාතික වනෝද්‍යානය තුළ ය.

මෙම අක්‍රමවත් නීති විරෝධී මාර්ග සංවර්ධනය හා වනෝද්‍යානයේ කැණීම් හේතුවෙන් මෙවන් පුරා වස්තු රැසක් ජාතියට අහිමි වන්නට ඇත.

මෙවන් සම්පත් රටට, ජාතියට අහිමි කරමින් සිදු කරන සංවර්ධනයෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද යන්න පැහැදිළි නැත.

2009 අංක 22 දරන පනතින් අවසන් වරට සංශෝධිත 1937 අංක 02 දරන වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 3, 5, 6, යන වගන්ති සියල්ල උල්ලංඝනය කරමින් වනෝද්‍යානය තුළට අනවසරින් ඇතුලු වී මාර්ග ඉදි කිරීම, වනජීවී වාසස්ථාන විනාශ කිරීම, ස්ථිර පාලම් ඉදි කිරීම, ගස් කපා ඉවත් කිරීම, පස් ලබා ගැනීම සඳහා විශාල වලවල් කැනීම, වනාන්තර ඉඩම් මායිම් කණු සිටුවා වෙන් කිරීම යන සියලු ක්‍රියාකාරකම් සිදු කරති. නමුත් ඊට එරෙහිව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැත.

රක්ෂිත වනාන්තර පියවරෙන් පියවර මෙසේ වනසද්දී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය මෙසේ නිහඬව සිටින්නේ මක් නිසාදැයි විශාල ප්‍රශ්නයකි. ලංකාවේ විශාලතම ජාතික වනෝද්‍යාන සංකීර්ණය වන විල්පත්තුවට සිදු කෙරෙමින් පවතින සියලු හානිකර ක්‍රියා වහාම නතර කිරීමට පියවර ගන්නා ලෙස අප අදාළ වගකිව යුතු අංශ වලින් ඉල්ලා සිටිමු. එසේ නොමැති වුවහොත් අවසානයේ ඉතිරි වන්නේ ඛණ්ඩනය වූ හා වනජීවීන්ගෙන් තොර කුඩා විල්පත්තු වනාන්තර කුට්ටි කිහිපයක් පමණි. මෙම තත්ත්වය ඇති නොවන්නට අදාළ අංශ කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුව ඇතත් එවැන්නක් පෙනෙන්නට නැත.

- සජීව චාමිකර

මුලට